රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

අධ්‍යාපන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරුවලට පත් කිරීම - 2024**

පහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු ගණන |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ | 15 |
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් | 04 |
| මුළු පුරප්පාඩු ගණන | 19 |

1. **සුදුසුකම්**

   I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

   II. ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස්වීමෙන් පසු කාලය තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

   III. සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම.

2. **අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

   I. මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, 2024.03.20 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   II. ඔබගේ මෑතකදී ලබා ගන්නා ලද අහල් 2x2½ වර්ණ ඡායාරූපයක් අයදුම්පතේ දකුණු පස ඉහළ කෙළවරෙහි අලවා එවිය යුතු වේ.

3. **ක්‍රමවේදය**

   රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ප්‍රකාරව, පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් මේ සමඟ දක්වා ඇති ලකුණු පටිපාටියේ සඳහන් නිර්ණායක අනුව ලබාදෙනු ලබන ලකුණු මත 2024.06.30 දින දක්වා පුරප්පාඩු වන තනතුරුවලට නිලධාරීන් පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය පරිදි සේවා අවශ්‍යතාවය මත අධ්‍යාපන ලේකම්ගේ අභිමතය අනුව සිදු කරනු ලැබේ.

4. අදාළ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. මෙම තනතුරු වලට පත්කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

5. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරනු ලබන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

වසන්තා පෙරේරා
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

2024.02.28